# හිනා මනා

**එකට එක**

**කොන්දොස්තර** මේ මහත්තය බහින්නෙ කොහෙන්ද?

**මගියා** බහින්නෙ ඉස්සරහ දොරෙන්.

**කොන්දොස්තර** විහිළු කරන්න එපා. බහින්නෙ කොහෙන්ද කියල කියන්නකො .

**මගියා** විහිළුවක් නෙවෙයි. බහින්නෙ ඉස්සරහ දොරෙන්

**කොන්දොස්තර** මගේ යකා අවුස්සන්නෙ නැතිව බහින්නෙ කොහෙන්ද කියල කියනව

**මගියා** මගේ යකා අවුස්සන්නෙ නැතිව මං කියන එක පිළිගන්නව නැත්තං බහිනකොට බලන් ඉන්නව බැස්සෙ කොහෙන්ද කියල.

**කොන්දොස්තර** එහෙනං කියනව තමුසෙ නැග්ගෙ කොහෙන්ද කියල .

**මගියා** නැග්ගෙ පස්සෙ දොරෙන්

**කොන්දොස්තර** අය්යෝ තෝ වගේ කාලකන්නියෙක් අහුවුනාම දවස ඉවරයි

**මගියා** තෝ වගේ කාලකන්නියෙක් අහුවුණාම මගෙත් දවස ඉවරයි.

**මානසික ලෙඩ**

**සිරිපාල දිනක් කනප්පුවක් ඇවිදිනවා බලන්නට ගියේය. එදින නිවසට පැමිණි සිරිපාලට පෙනුනේ නිවසේ බඩු මුට්ටු සියල්ලම ඔබ මොබ ඇවිදිනවා මෙනි. දින කීපයක් ගත වුණද සිරිපාලගේ මෙම අසනීපය සුව වූයේ නැත. අවසානයේ ඔහු මානසික රෝහලට ඇතුලත් කෙරිණ. එහිදී ඔහුට ප්‍රතිකාරවලින් සුව වූ නිසා වෛද්‍යවරයා කීවේ තමා කැඳවාගෙන යාමට නිවසින් කිසිවකු ගෙන්නා ගන්නා ලෙසයි. සිරිපාල තම පියාට ලිපියක් ලීවේය.එය කවරයක බහා මුද්දරයක් ගෙන එහි පිට පැත්තේ කෙල ගා කවරයේ අල වන්නට සූදානම් වන විටම එය බිමට වැටිණ. අවාසනාවකට එය වැටුණේ කැරපොත්තෙකු ගේ පිට මතට ය.**

**මුද්දරයෙන් කැරපොත්තා සහමුලින් ම වැසී ගියේය. මෙය නොදත් සිරිපාල මුද්දරය සොයන විට දුටුවේ එය ඇවිදින බවයි. ඔහු වහා ගොස් තමාගේ රෝගය තවමත් සුව වී නැති බව වෛද්‍යවරයාට කීවේය.**


**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au




අපේ ආණ්ඩුවක් ආපු ගමන් ගෝඨාභයලා
හිරේ දාලා ජම්පර් අන්දවනවා
**එජාප මන්ත්‍රී හේශා විතානගේ**

මන්ත්‍රීතුමා නඩුවත් අහල තීන්දුවත් දීලා
ඉවරයි වගේ
**අබරන්**




ALPHA ACADEMY
• PRIMARY • SECONDARY • VCE

ENROLMENTS OPEN

YEAR 2-6 — ENGLISH, MATHS AND GA GENERAL COURSE
YEAR 5-8 — SCHOLARSHIP TEST PREPARATION
YEAR 5-10 — ENGLISH, MATHS AND SCIENCE GENERAL COURSE
YEAR 9-10 — VCE PREPARATION
YEAR 11-12 — VCE CHEMISTRY AND BIOLOGY ENGLISH RECOMMENDED TEXTS, ANALYTICAL WRITING

CLASSES AT DANDENONG
MOUNT WAVERLEY, DANDENONG, BERWICK & CRAIGIEBURN

Classes conducted by Current School Teachers
INQUIRIES - 0480 139 747